ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැඳුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.
011 279 7400
011 286 4051

මගේ අංකය / எனது இல / My No. LCGD/R & D/පොදු/උරුමය/ 2023 — අංකය / இல / No — දිනය / திகதி / Date 2024.03. 01

සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,
සියලුම අන්තර් පළාත් කොමසාරිස්වරුන්/සහකාර ඉඩම් කොමසාරිස්වරුන්,

**<u>"උරුමය වැඩසටහන" II අදියර සඳහා නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීම</u>**

උරුමය වැඩසටහන II අදියර හා III අදියර ආරම්භ කිරීම මැයෙන් මාගේ සමාංක හා 2024.01.29 දිනැතිව ඔබ වෙත යොමු කරන ලද ලිපියට වැඩිමනත් වශයෙනි.

මේ වනවිට ජනාධිපති ලේකම් කාර්යාලයේ උරුමය ජාතික මෙහෙයුම් කාර්යාලය මඟින්, උරුමය සින්නක්කර ඉඩම් අයිතිය ලබා ගැනීම සඳහා වන 1908 ක්ෂණික ඇමතුම් අංකය මඟින් හා දිවයින පුරා සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් උරුමය වැඩසටහන සඳහා ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇත. එම ක්‍රමවේද මඟින් ලියාපදිංචි වන අයදුම්කරුවන්ගේ තොරතුරු ද ඔබ වෙත යොමු කරනු ඇත. එසේ ඔබ වෙත ඉදිරිපත්වන අයදුම්කරුවන් සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකම හා අන්තර් පළාත් කලාප වලට අදාළව සෘජු ඉඩම් කළමනාකරණය සිදු කරන අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයකම පිහිටුවා ඇති උරුමය ඒකකයේ ලියාපදිංචි කර ගැනීමට කටයුතු කරන්න. ඉන් අනතුරුව ඔබ විසින් නිසි සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා මාගේ 2023/01 දරණ චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතුය.

එහිදි එම අයදුම්කරුවන් ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ ලබා දුන් අවසරපත්‍රයක් මත ඉල්ලුම් කරන්නේ නම්, ඇමුණුම 1 මඟින් රජයට භාරගෙන අදාල ලෙජරයේ සටහනක් යොදා යාවත්කාලීන කිරීමද ඉල්ලුම් කරනු ලබන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ ලබා දුන් දීමනාපත්‍රයක් මත නම් ඇමුණුම 2 මඟින් රජයට භාරගෙන ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීම ද යන මූලික කටයුතු ද සිදු කරන්න.

ඉන් අනතුරුව එම ලේඛන e-slims පද්ධතියේ උරුමය නව යොමුව සඳහා ඇතුලත් කිරීමට කටයුතු කල යුතු අතර එම උරුමය නව යොමුවට දත්ත ඇතුලත් කල යුතු ආකාරය හා "O" රේඛා චිත්‍ර සඳහා මැනුම් ඉල්ලීමක් e-slims පද්ධතිය මඟින් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කරන ආකාරය පිළිබඳව සවිස්තර තොරතුරු ඔබ වෙත වෙනම දැන්වීමට කටයුතු කරනු ලැබේ.

**e-slims පද්ධතිය තුල ඇතුලත් කර ඇති අවසරපත්‍ර සඳහා උරුමය වැඩසටහන යටතේ නිදහස් දීමනාපත්‍ර ලබා දීම.**

උරුමය වැඩසටහනේ I අදියර සඳහා තෝරාගන්නා ලද ප්‍රදානපත්‍ර 10,000 ට අමතරව මේ වන විට e-slims පද්ධතිය තුල විවිධ අවස්ථාවන්හි පවතින දීමනාපත්‍ර අයදුම්පත් පවති. එනම් උරුමය වැඩසටහන ආරම්භ කරන අවස්ථාව වන

ආයතන / நிர்வாகம் / Admin 011 279 7479 / 011 287 3033 | ගිණුම් / கணக்கு / Accounts 011 287 5833 / 011 286 4462 | ඉඩම් I / காணி I / Land I 011 287 4025 / 011 288 3812 | ඉඩම් II / காணி II / Land II 011 287 5834 / 011 287 3110 | ඉඩම් III / காணி III / Land III 011 279 7482 / 011 288 3635
ඊමේල් / ஈ-மெயில் E-mail - landcom@landcommdept.gov.lk   වෙබ් ලිපිනය / இணையம் Web Address - www.lancommdept.gov.lk

විටත් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දුන් අවසරපත්‍ර මැනුම්පතිගේ මැනුමක් සහිතව නිරවුල්ව භුක්ති විඳින අවස්ථාවලදී මෙම ඉල්ලුම්පත්‍ර යොමු කර ඇති බැවින් ඒ සඳහා මෙම ක්‍රියාවලිය තුල කඩිනමින් කටයුතු කල හැකිය. එවැනි අවසරපත්‍ර තොරතුරු ප්‍රාදේශිය ලේකම්, පළාත් ඉඩම් කොමසාරිස්, අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් ජනරාල් යන කාර්යාල මට්ටමින් e-slims පද්ධතිය තුල පවතී. එම විවිධ මට්ටම් වල පවතින ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබා ගැනිමට සුදුසුකම් සපුරා ඇති අවසරපත්‍ර වලට අදාල තොරතුරු සියලුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන් ආවරණය වන පරිදි සකස් කරන ලද ලැයිස්තුව මා විසින් මේ සමඟ ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබේ. එහි මෘදු පිටපතක් ද විද්‍යුත් තැපෑලෙන් ඔබ වෙත යොමු කරනු ලැබේ. එහිදී ජීවිත භුක්තිය සඳහා දීමනාපත්‍ර සැකසීමට යොමු කරනු ලැබූ ඉල්ලීම් ඉවත් කර ඇති අතර ඔබ වෙත යොමු කරනු ලබන තොරතුරු ලැයිස්තුවේ මෘදු පිටපතේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, අයදුම්කරුවන්ගේ තොරතුරු පහසුවෙන් හඳුනාගත හැකි පරිදි පහත අයුරින් වර්ණ ගැන්වීම් සිදුකර ඇත.

- රතු - අඩුපාඩු සකස් කිරීමට ඇති, ප්‍රා.ලේ කාර්යාලවල විෂය නිලධාරි (ORLM ) හෝ ඉඩම් නිලධාරී ( LO ) ගිණුම්තුල පවතින අයදුම්පත්
- කොල - දීමනාපත්‍ර සකස් කිරීම සඳහා ප්‍රාදේශිය ලේකම් වෙත යොමුකර ඇති අයදුම්පත්. (ORDS)
- කහ - පළාත් හෝ අන්තර් පළාත් කාර්යාල ගිණුම්තුල පවතින අයදුම්පත් (PMA, APLC,PLC හෝ IPMA,AIPLC,IPLC)
- නිල් - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යොමු වී ඇති අයදුම්පත් ( MA )

මෙම අවසරපත්‍ර වලට අදාලව උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරිම සඳහා II අදියර ආරම්භයේදි කටයුතු කරනු ලැබේ. එබැවින් ඔබ වෙත එවනු ලබන ලැයිස්තුවට අදාලව මේ වන විට ජීවිත භුක්ති අවස්ථාවේ පවතින ඉල්ලිම්, ගැටලු සහිත ඉල්ලීම් හෝ බලපත්‍රකරු මියගොස් ඇති අවස්ථා ඇත්නම් එවැනි ඉල්ලීම් හැර අනෙකුත් ඉල්ලීම් සියල්ල සඳහා ආ ජ්.ආ 118 ආකෘතිය මගින් “O” රේඛා චිත්‍ර සඳහා වන මැනුම් ඉල්ලීමක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමුකරන්න. එම අවස්ථාවේදී කැබලි විස්තර ලැයිස්තුවේ සංශෝධනයක් විය යුතු බව ඔබ විසින් නිරික්ෂණය කරයි නම් ඒ සඳහා වන ඉල්ලීම් ලිපියක්ද මේ සමඟ යොමු කල යුතුය. ඉල්ලුම් කරනු ලබන ඉඩම සඳහා අතුරු බෙදීම් සිදු කල යුතු වන්නේ නම් එවැනි ඉල්ලීම් සඳහා පසුව විධිමත් පරිදි තහවුරු කරගෙන ඉදිරි කටයුතු කල යුතුය.

e-slims පද්ධතිය තුල පවතින මැනුම් ඉල්ලීමක් යොමු කරන ලද අයදුම්පත්වලට අදාලව උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදානපත්‍ර ලබා ගැනිමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ගෙන් උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනිමට වන ඉල්ලිම ලිඛිතව ලබා ගැනිමට කටයුතු කරන්න. ඉන් අනතුරුව මාගේ අංක 2023/01 දරණ චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය මගින් ඉඩම රජයට භාරගැනිමට හා ඒ සම්බන්ධව ලෙජරයේ සටහන් යොදා යාවත්කාලින කිරිම සිදු කරන්න.

තවද මා විසින් ඔබ වෙත එවනු ලබන ලැයිස්තුවේ අයදුම්පත පවතින්නේ e-slims පද්ධතියේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමේ නම් ඔබ විසින් එය ඉදිරියට යොමු කරන අවස්ථාව වන විට ඉඩම රජයට භාරගැනිම සිදුකර ඇත්නම්, උරුමය වැඩසටහන යටතේ ප්‍රදානපත්‍රයක් ලබා ගැනිමට වන ඉල්ලිම, ඇමුණුම 01 හා යාවත්කාලින කරන ලද ලෙජරයේ ප්‍රාදේශිය ලේකම් හෝ සහකාර ප්‍රාදේශිය ලේකම් සහතික කල පිටපතක් ඇමුණුම් ලෙස ඇතුලත්

කරන්න. එම ඇමුණුම් e-slims පද්ධතියේ දැනට තොරතුරු ඇතුලත් කර ඇති යොමුව තුලටම ඇතුලත් කිරීමේ පහසුකම ලබා දී ඇත.

අදාල අයදුම්පත මේ වන විටත් ප්‍රාදේශිය ලේකම් විසින් අනුමත කර පළාත් ඉඩම් කොමසාරිස් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙත යොමු කරනු ලදුව PMA/IPMA හෝ ඊට ඉදිරි පියවරක පවතින්නේ නම් හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමේ පවතින අයදුම්පතක ඔබ විසින් එය ඉදිරියට යොමු කරන අවස්ථාව වන විට ඉඩම රජයට භාරගැනිම සිදුකර නොමැති නම් හෝ එම අවසරපත්‍රයට අදාලව උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදානපත්‍රය ලබා ගැනිමට වන ඉල්ලිම, ඇමුණුම 01 හා යාවත්කාලින කරන ලද ලෙජරයේ සහතික කල පිටපත pdf ගොනුවක් ලෙස සකසා අයදුම්කරුගේ නමින් නම් කර lcgdurumaya@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් හෝ වැඩිදුර තොරතුරු අවශ්‍ය වේ නම් ඒ සම්බන්ධව මා අමතන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

කේ.ඩී.බන්දුල ජයසිංහ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්

01.ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය -කරු.දැ.ගැ.ස
02.ලේකම්, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය -කරු.දැ.ගැ.ස
03. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු -කරු.දැ.ගැ.ස
04.මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව -කරු. අ.ක.ස. හා දැ.ගැ.ස